# වික්ටෝරියානු සදාචාරය

යම්කිසි අයුරකින් එංගලන්තයේ ධනපති ක්‍රමය බිහි වූ මුල් අවධියෙහි දුම්රිය නිෂ්පාදනය වී තිබුණි නම් එවිට මිනිසුන්ට තම ගම්බිම්වල සිට නගරයේ පිහිටි කර්මාන්තශාලාවල සේවයට පැමිණීමට හැකිවීමට තිබුණි. එසේ වූවා නම් ඇතැම් විට විස්තෘත පවුල පවත්වාගෙන යෑමේ ඉඩක් ද තිබුණි. එහෙත් සමාජ විකාශය එසේ නො සිදුවෙයි. දුම්රිය නිෂ්පාදනයට පෙර තවත් බොහෝ දෑ නිර්මාණය කළයුතුව තිබුණි. වානේ කර්මාන්තය, වාෂ්ප යන්ත්‍රය ආදිය නිර්මාණය වීමට යම් කලක් ගතවෙයි. ඒ කාලය තුළ මිනිසුන් ගම් බිම් පාළු කරමින් කර්මාන්තශාලා කරා ඇදී යෑම වැළැක්විය හැකි නො වේ.

සමාජ විකාශයේ ඇතැම් දේ වෙනත් දෑට පසුව නිර්මාණය වීමේ කතාවට අමතරව මෙහි තවත් කරුණක් වෙයි. විස්තෘත පවුල බටහිර යුරෝපය හා සම්බන්ධයෙන් ගත්කල කතෝලික චින්තනයේ නිර්මාණයක් වෙයි. එහෙත් මාටින් ලූතර්, කැල්වින් ආදී පූජකවරුන්ගේ නායකත්වයෙන් බිහි වූ රෙපරමාදු ආගම හා සම්බන්ධයෙන් ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි  චින්තනය වැදගත් වෙයි. විස්තෘත පවුල කුඩා වී න්‍යෂ්ටික පවුල බවට පත්වූයේ ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙහි ය. මේ චින්තන දෙක අතර පැහීමක් නැති බැවින් ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය අධිපතිවාදී චින්තනය බවට පත්වීමෙන් පසුව විස්තෘත පවුලට තවදුරටත් ඉඩක් නැත. අද වන විට සමාජ විකාශයෙහි විස්තෘත පවුලට පමණක් නොව න්‍යෂ්ටික පවුලට ද හිමි වී තිබූ වැදගත්කම නැතිවී යනු දැකගත හැකි ය. අද බටහිර රටවල පවුල් සම්බන්ධතා බිඳ වැටී පුද්ගලයා ම ඉදිරියට පැමිණ ඇත. මේ ඇතැමුන් කියන ආකාරයට පශ්චාත්නූතනත්වයක් නිසා සිදුවන්නක් නොව බටහිර ක්‍රිස්තියානි නූතනත්වය තව තවත් විකාශය වීම නිසා සිදුවන්නකි.

එංගලන්තයේ වික්ටෝරියා රැජින රජ කළ සමයෙහි, එනම් දහනව වැනි සියවසෙහි දෙවැනි භාගයෙහි හා ඉන් පසුව බලපැවැත්වූයේ ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය ය. සමාජයෙහි සමාජයීය පෞද්ගලිකත්වය මේ අවධිය වන විට වර්ධනය වෙමින් පැවතුණි. එහෙත් සුචරිතය හෙවත් සදාචාරය එකල ද තීරණය වූයේ කතෝලික චින්තනයෙහි ය. මේ වන විට එංගලන්තයෙහි විස්තෘත පවුල ද බොහෝ සේ අභාවයට ගොස් තිබුණි. එසේ  නම් සදාචාරය කතෝලික චින්තනයෙහි තීරණයවන්නේ කෙසේදැයි යමකුට ප්‍රශ්න කළහැකි ය. එයට හේතුව ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙහි හා යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙහි සදාචාරයක් ඒ වන විට ද ගොඩ නොනැගී තිබීම ය.

සදාචාරය යන්න ඒ ඒ සංස්කෘතිය විසින් තීරණය කෙරෙන්නෙකි. සදාචාරය හෙවත් යහපත් ආචාර ධර්ම කවරේදැයි තීරණය කිරීම ඒ ඒ සමාජයේ කටයුත්තක් වෙයි. ලෝකයේ කිසි දිනෙක කිසි තැනක වාස්තවික නිරපේක්ෂ සදාචාරයක් තිබී නැත. අනෙක් දෑ මෙන්ම සදාචාරය ද සාපේක්ෂ ය. එක් සමාජයක සදාචාරය යැයි සැලකෙන කිසිවක් වෙනත් සමාජයක දුරාචාරයක් ලෙස සැලකීමට ඉඩකඩක් ඇත. අද බටහිර සදාචාරය නමින් සිදුවන ඇතැම් ක්‍රියා පෙරදිග ඇතැම් සමාජවල නොකළයුතු ක්‍රියා ලෙස සැලකෙයි. එහෙත් ඒ ඇතැම් පෙරදිග සමාජ ද තවත් ටික කලක් ගතවීමෙන් පසුව වෙනස් වී අද බටහිර සමාජය අනුකරණය කරන සමාජ බවට පත්වනු ඇත. ඒ තම සංස්කෘතිය පවත්වාගෙන යෑම හා ප්‍රචලිතකිරීම බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙහි අංගයක් වීම නිසා සිදුවන්නකි.

එංගලන්තයේ වික්ටෝරියා රැජිනගේ සමයෙහි මුළුමනින්ම බලපෑවේ ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය නොවන නමුත් සියල්ල විකාශය වෙමින් පැවතියේ ඒ දිශාවට ය. තමාගේ ම වූ සුචරිතයක් වර්ධනය කරගෙන නොසිටි එංගලන්ත සමාජයට පැරණි වැඩවසම් සමාජයෙහි වූ ඇතැම් සුචරිත ආභරණ පැළඳගැනීමට සිදුවිය. ඒ අනුව විවාහය යනු දෙවියන් වහන්සේ ඉදිරියේ උන්වහන්සේගේ කැමැත්ත නිසා සිදුවන දෙයක් පමණක් නොව මරණයෙන් පමණක් කෙළවර වන්නකි. ඒ ඒ පුද්ගලයාට වඩා සමාජ සංස්ථාවක් වූ විවාහය වැදගත් ලෙස සැලකිණි.

එහෙත් එවැනි අදහස් එංගලන්තයේ එවකට වර්ධනය වෙමින් පැවති බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට පටහැණි විය. පුද්ගලයාට අවශ්‍ය නම් විවාහය මරණයට පෙර කෙළවරකිරීමට ඉඩකඩක් තිබිය යුතු විය. එසේ ම පුද්ගලයාගේ මනාපය පරිදි විවාහයෙන් බාහිර වූ සම්බන්ධතා ඇතිකරගැනීමට ද ඉඩක් තිබිය යුතුවිය. එංගලන්ත සමාජයෙහි එවැනි අදහස් පැතිරී ගිය ද, ඒ නීතිගත තත්ත්වයකින් නො වී ය. එංගලන්ත සභාව නම් ආගම ඇතිවූයේ ම

© Prof. Nalin De Silva

අටවැනි හෙන්රි රජුගේ දික්කසාදයකට පාප්වහන්සේ අනුමැතිය දීම ප්‍රතික්ෂේපකිරීම නිසා බව මතක්කරගැනීම මෙහි දී වැදගත් වෙයි.

සමාජයක නීති පද්ධතිය සාමාන්‍යයෙන් සමාජයේ ක්‍රියාත්මක වන සදාචාරය ආකල්ප ආදියට පිටුපසින් වෙයි. එයට ප්‍රධාන හේතු නීති පද්ධතිය පාර්ලිමේන්තුව, රජතුමා හෝ වෙනත් ආයතනයක් විසින් බිහිකළ යුතුවීමත් ඒ නීති එලෙස පද්ධතියක් ලෙස සූත්‍රගත කෙරෙන්නේ ම සමාජයට ඒ අවශ්‍ය වීමෙන් පසුව වීමත් ය. මේ සාමාන්‍යයට විරුද්ධව යන තැන්ද නැතුවා නො වෙයි. අනාගතය ගැන කල්පනාකර නීති පැනවීමේ හැකිකම ද ඇති බැවින් ඉහත සඳහන් සාමාන්‍යය සැමවිට ම ගැලපෙන්නක් නොවන බව අවබෝධ කරගත යුතු ය. එහෙත් සාමාන්‍යයෙන් සමාජයක නීතිය සමාජයේ ආකල්ප, සදාචාරය ආදියට පිටුපසින් වෙයි.

උදාහරණ මගින් ඒ පැහැදිලිකර දිය හැකි ය. අද වන විට පරිගණක ආශ්‍රිත ක්‍රියාකාරකම් පිළිබඳ පැහැදිලි නීති නොමැත. තොරතුරු තාක්ෂණය වර්ධනය වෙමින් පවතින නමුත් ඒ සම්බන්ධ නීතිය ගැන නීති සම්පාදකයන් තවමත් හරිහැටි සිතාබලාවත් නැත. පරිගණකය ආධාරයෙන් නිර්මාණයකෙරෙන ලිපියක් නීතිය ඉදිරියේ කෙතරම් වලංගුබවක් ගන්නේ ද ආදී වශයෙන් ප්‍රශ්න රාශියක් වෙයි. එහෙත් ඒ සම්බන්ධයෙන් නීතිය තවමත් බොහෝ දුරට නිහඬ ය. නීතිය නිහඬ වූ පමණින් සමාජයේ ක්‍රියාකාරකම් නොනවතියි. එසේ ම නීතියක් නොමැතිවීම හේතුකොටගෙන ද ඇතැම් දෑ වර්ධනයකිරීමට පුද්ගලයන්ට, එනම් අවසානයේ දී සමාජයට, අවස්ථාව ලැබෙන බව ද සඳහන් කළයුතු ය.

පසුගිය කාලයේ බටහිර ඇතැම් රටවල විද්‍යාව හා සම්බන්ධ පරයේෂණ සම්බන්ධයෙන් නීති රීති පැනවී ඇත. ඇතැමුන් කලාව කලාව වෙනුවෙන් යන ප්‍රතිපත්තියක පිහිටීමට උත්සාහ කරන බවත් කලාකරුවාට අසීමිත නිදහසක් තිබිය යුතු යැයි ප්‍රකාශකරන බවත් අපි දනිමු. එහෙත් කලාකරුවාට තමන්ට අවශ්‍ය ආකාරයට කලාකෘති නිපදවීමට අයිතියක් ඇතැයි කියන මොවුන් සැලකිල්ලට නොගන්නා කරුණ නම් කලාකෘතියක් සමාජගත වන බව ය. කලාකෘතිය කලාකරුවාට පමණක් සීමාවන්නේ නම් කලාකරුවාට තමන්ට ඕනෑම දෙයක් නිර්මාණයකිරීමට අයිතියක් ඇති බවට තර්ක කළහැකි ය. එහෙත් නිපදවන ලද කලාකෘතියක් කලාකරුවා හැරදා සමාජයීය වස්තුවක් බවට පත්වෙයි. එවිට සමාජයට කලාකෘති සම්බන්ධයෙන් ඇතැම් නීති පැනවීමට සිදුවෙයි.

විද්‍යාඥයන්ට අවශ්‍ය ආකාරයට පරයේෂණකිරීමේ නිදහසක් නැතිබව කලාවිචාරයේ යෙදෙන ඇතැම් පුස්සෝ නොදනිති. පොතක් පතක් පමණක් කියවා ඊනියා ප්‍රබුද්ධයන් බවට පත්වන මොවුහු ඊනියා කලාවේ නිදහසක් ගැන බෙරිහන් දෙති. ප්‍රබුද්ධයන් ලෙස පෙනී සිටින මේ බොහෝ පුද්ගලයනට ඇත්තේ යමක් කීමට හෝ ලිවීමට ඇති හැකියාව පමණකි. බාහිරින් ප්‍රබුද්ධ වෙසක් මවාගෙන සිටිය ද ඔවුන්ගේ ඇතුළත හරයක් නැත. එබැවින් ඔවුහු පුස්සෝ වෙති.

කලින් කී විද්‍යාඥයන් සම්බන්ධ කතාවේ උදාහරණයක් ලෙස ගතහොත් බටහිර රටවල විද්‍යාඥයන්ට මිනිස් කළල ගැන ජීවතාක්ෂණය යොදාගනිමින් කරන පරයේෂණ සම්බන්ධයෙන් සීමා වෙයි. අද මෙරට ඇතැම් විද්‍යාඥයන් ද සත්ත්වයන් සම්බන්ධ කරන පරයේෂණ සඳහා සදාචාර සංග්‍රහයක් (moral code) සකස්කරගෙන ඇත. ඊනියා කලා විචාරක හා කලාකරු පුස්සෝ මේ කිසිවක් නො දනිති. අවසාන වශයෙන් ගත්කල ඔවුන් ඉල්ලා සිටින්නේ කලාකරුවන්ට ඕනෑම කලාකෘතියක් නිරාමාණයකිරීමට පෞද්ගලික නිදහසක් තිබිය යුතු ය යන්න ය. බටහිර ක්‍රිස්තියානි නූතනත්වය ම පෞද්ගලිකත්වය මත රඳා පැවතුණ ද එයට සමාජය මුළුමනින් ම අමතක කළ නො හැකි ය.

කෙසේ හෝ වේවා අප සාකච්ඡාකරමින් සිටින්නේ එංගලන්තයේ වික්ටෝරියා සමාජයේ සදාචාරය පිළිබඳ ව ය. ඒ සමාජයේ නීතියට, විශේෂයෙන් ම විවාහය හා පුද්ගලයන්ගේ ලිංගික සම්බන්ධකම් පිළිබඳ නීති පද්ධතියට වෙනස් ව සමාජය ගමන්කරමින් පැවතිණි. එබැවින් නීති පද්ධතියට හොරෙන් පුද්ගලයෝ විවිධ සම්බන්ධකම් පැවැත්වූහ. වික්ටෝරියානු සමාජයේ කුහකත්වය ඇතිවූයේ එලෙසිනි. ඒ සමාජයෙහි නීතියෙන් පිළිගැණුනු සම්බන්ධකම් එක් පද්ධතියක් විය. එහෙත් ප්‍රායෝගික වශයෙන් ගත්කල සමාජයේ ක්‍රියාත්මක වූ පුද්ගල සම්බන්ධකම් තවත් පද්ධතියක්

විය. පුද්ගලයෝ  සමාජයේ පිළිගැණුනු පද්ධතියට පක්‍ෂව කතාකරන අතර ම වෙනත් පද්ධතියක් අනුව ජීවත්වූහ. ඒ පද්ධති දෙක අතර වෙනස වැඩිවත් ම කුහකත්වය ද වැඩිවිය.

එහි තේරුම වුයේ සමාජයේ මතුපිටින් පිළිගැණුනු සදාචාරය දැඩි නීතිවලට යටත්වීම ය. සමාජය ම තමන්ට අවශ්‍ය දේ සඟවාගෙන කුහක සදාචාරයක් තව තවත් ඉස්මතු කළහ. කාන්තාවන් අඳින ඇඳුම් කෙතරම්දුරට ශරීරය වසාගෙන සිටිය යුතු ද ආදී ප්‍රශ්නවල දී ද දරදඬු නීති රීති සකස්කර තිබුණි. උදාහරණයක් වශයෙන් කාන්තාවකගේ පාදයේ වළළුකර පවා නොපෙන්විය යුතු ය වැනි ආකල්පයක් එංගලන්ත වික්ටෝරියානු සමාජයේ විය. මේ සියළු නීති, සදාචාර පද්ධති තිබිය දී සමාජය එයට එරෙහිව නිහඬ කැරැල්ලක් ගසමින් ඉන් බාහිර පද්ධතියක ජීවත්විණි.

වික්ටෝරියානු එංගලන්තයේ කුහක සදාචාරය පසුකලෙක බිඳ වැටිණි. ඒ බින්දේ ප්‍රංශය විය හැකිය. කෙසේවෙතත් එංගලන්ත සමාජයෙන් ම එයට විරුද්ධව මතයක් ගොඩනැගී අවසානයේ දී වික්ටෝරියානු සදාචාරය සමාජයෙන් ප්‍රතික්‍ෂෙප විණි. එංගලන්ත සමාජය වික්ටෝරියානු කුහකත්වයට එරෙහිව කටයුතුකිරීමේ දී  ප්‍රංශ ආභාසය ලබාගත්තේ ද  නැත්ද යන ප්‍රශ්නය මෙහිදී අපට එතරම් වැදගත් නො වෙයි. එංගලන්තය පෞද්ලිකත්වය ඉස්මතුකිරීමේ බටහිර ක්‍රිස්තියානි නුතනත්වය ඔස්සේ දිගටම ගියේය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva